# හිතුවක්කාර හා පැංචි



ලිසාරා ශෙනුලි අභයවංශ

ලිසාරා ශෙනුලි අභයවංශ

කර්තෘ

# පළමු දිගහැරුම

මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

**1 වසර B**

**2026/05/10**

ISBN- 978-624-211-047-09

# පිදුම

මට අකුරු කියලා දෙන ගුරුවරුන් හැමදෙනාට

ම මෙම පොත උපහාරයක් වේවා !



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කිරීමේදී, බාලිකා අධ්‍යාපනය තුළ විශේෂ හැරවුම් ලක්ෂයක් ලෙස, මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන "හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය" සඳහන් කළ හැකිය.

දශකයකට ආසන්න කාලයක් පුරා දහස් ගණනක් දරුවන් ගත්කතුවරුන් ලෙස සමාජයට දායාද කිරීම, පාසලක් වශයෙන් අප ලබා ඇති විශිෂ්ට ජයග්‍රහණයකි.මෙවර ද, වෙනත් පාසල් සමඟ එක්ව, පාසල් දරුවන්ට නව අත්දැකීම් ලබාදීමත්, සන්නිවේදන නිපුණතා, සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක හැකියාවන් වර්ධනය කිරීමත් අරමුණු කර ගනිමින්, ඔවුන් පොත් ලිවීමට ප්‍රේරණය කරන ලදී.

එහි ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වූ ළමා ග්‍රන්ථ හරහා, ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතයක් වන ශ්‍රී දළදා වහන්සේ කන්ද උඩරටට වැඩම කරවූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ ප්‍රධාන අරමුණ වේ.මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා නිර්මාණකරණයෙන් දායක වූ සියලු පාසල් දරුවන්ටත්, ඔවුන්ට මඟ පෙන්වූ ගුරුභවතුන්ටත්, සහාය ලබාදුන් සියලු දෙනාටත් අපගේ හෘදයාංගම ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව

2026.05.10

ඔන්න එකමත් එක කාලෙක හා පැංචියෙකුයි හා අම්මෙකුයි හිටියා. එයාලට තිබුණා ලස්සන බිම්මල් ගෙයක්.



ඒ හා පැංචිට ගොඩක් සෙල්ලම් බඩු තිබුණා. කොච්චර සෙල්ලම් බඩු තිබුණාත් එයා දකින දකින දේ ඉල්ලන්න පුරුදු වෙලා හිටියේ.


හා අම්මා අමාරුවෙන් ඒ හැමදේම ගෙනත් දුන්නා. එයා හා පැංචිට හරිම ආදරෙයි.

එයාට මොනවා ගෙනත් දුන්නත්, ඒ සෙල්ලම් බඩු වලට ආස වුණේ අරන් දෙනකම් විතරයි.

සෙල්ලම් බඩු වලින් එයාගේ ගෙදර පිරීලා තිබුණා. එත් එයාට හැමදාම අලුත් සෙල්ලම් බඩුවක් ඕන වුණා.



හා පැංචි ඉල්ලන දෙයක් ගෙනත් දුන්නේ නැත්නම් බිම පෙරළිලා අඬනවා.



එක දවසක් හයියෙන් වැස්සා, කාටවත් එළියට යන්න බැරි වුණා.



එදා හා පැංචි යාලුවෙකුගේ ඔටුන්නක් දැකලා ඒ ඔටුන්නට හා පැංචිට ආස හිතුණා.

එදා හා පැංචිට ඒ වගේ ලස්සන ඔටුන්නක් ඕන වුණා. කොහොමහරි ගෙනත් දෙන්න කියලා ඇඬුවා.

"පුතේ, මේ වැස්සේ කොහොමද මම කඩේට යන්නේ" හා අම්මා දුකෙන් කිව්වා.

"නෑ මට ඔටුන්න ඕනමයි" හා පැංචි කිව්වා.

අම්මා කොච්චර කිව්වත් වැස්සේ යන්න බෑ කියලා, හා පැංචි ඇහුවේ නෑ.

ඉතින්, අම්මා වැස්සෙම කුඩයක් අරන් කඩේට ගියා.



හා අම්මා කඩේට ගිහින් ගොඩක් වෙලා ගියා. රෑ වුණා, දවල් වුණා, වැස්සත් නතර වුණා. ඒත් හා පැංචිගේ අම්මා නම් ආවේ නැහැ.



හා පැංචි ට දැන් හරිම තනියි. අම්මාව මතක් වෙවී අඬ අඬා පාර දිගේ බලාගෙන හිටියා. ඒත් අම්මා කවදාවත් ආවේ නැහැ.

හා පැංචි ගේ පුරා විසි කරලා දාලා තියෙන සෙල්ලම් බඩු දිහා බැලුවා. එයා අම්මට කරදර කරලා ගත්ත සෙල්ලම් බඩු එකක්වත් පරිස්සම් කරේ නෑ. වැස්ස වගේ ම ලොකු කඳුළු බෝල හා පැංචිගේ ඇස් වලින් වැටුණා.

ඉතින් යාලුවනේ, අපිත් දකින දකින දේ ඉල්ලන්නේ නැතුව ඉමු.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ දශකයකට වැඩි කාලයක් ක්‍රියාත්මක වූ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය මඟින් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් ලෙස සමාජයට දායාද කර ඇත. පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට මෙම වැඩසටහන මහත් දායකත්වයක් ලබා දී ඇති බව අධ්‍යාපනඥයන් විසින් පිළිගෙන ඇත.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සමඟ සමාන්තරව, මෙවර පාසල් දරුවන් පර්යේෂණාත්මක කෘති රචනා කිරීමට යොමු කිරීම මෙම ව්‍යාපෘතියේ වැදගත් හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණය වේගයෙන් වර්ධනය වන යුගයකදී, සමාජයට සරිලන ස්මාර්ට් පරම්පරාවක් බිහිකිරීම සඳහා නූතන පාසල් පද්ධතිය තාක්ෂණික මෙවලම් හා පොත්පත් දෙකම සමාන ලෙස භාවිතා කළ යුතු බව මෙය පැහැදිලි කරයි. එසේම, පොතක් හරහා දරුවෙකුට ලැබෙන ගැඹුරු ආස්වාදය වෙනත් කිසිදු මාධ්‍යයකින් සම්පූර්ණයෙන් ලබාගත නොහැකි බවද මෙහිදී විශේෂයෙන් අවධාරණය වේ.

අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම වන පොත්පත් වෙතින් දරුවන් ඈත් වීම වැළැක්වීම සහ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය උසස් කිරීම අරමුණු කර ගනිමින්, මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය විසින් "හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය" වසර ගණනාවක් පුරා සාර්ථකව ක්‍රියාත්මක කරමින් සිටී.

මෙම ව්‍යාපෘතිය හරහා පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම, සාරධර්ම මත පදනම් වූ නිපුණතා සහ නිර්මාණාත්මක හැකියාවන් වර්ධනය කිරීමත්, කාන්තාවන් සවිබල ගැන්වීමේ වැදගත්කම උදෙසා ඉතිහාසයේ විශිෂ්ට සේවාවක් කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීමත් ප්‍රධාන අරමුණු වේ.

මෙම සද්කාර්ය සාර්ථක කර ගැනීමට දායක වූ මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ දියණියන්ට, විදුහල්පතිනියට, ගුරුභවතුන්ට, දෙමාපියන්ට, ආදි ශිෂ්‍යාවන්ට සහ සෙසු පාසල් නියෝජිතයන්ටත්, දියවඩන නිලමේතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටත් අපගේ හෘදයාංගම ස්තුතිය පුද කරමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN- 978-624-211-047-09